**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

**<u>මාතර දිස්ත්‍රික්කය.</u>**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ තෙලිජ්ජවිල මහජන පුස්තකාලය ඉදිකිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.581,747 ක වියදම සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයෙන් නිවරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | පුවක්දොළ ජල ව්‍යාපෘතිය සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු රු.998,600 ක් කර්මාන්ත ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයෙන් නිවරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.197,461,065 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය 2019 වර්ෂයේදී සිදු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්
-------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
-------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 අංක 42 දරන සේවක අර්ථසාධක පනතේ සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත | 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභා සේවකයෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට බැරකළ යුතු රු.172,440 ක් බැරකර නොතිබූ අතර සේවකයාගේ වැටුපෙන් අයකළ යුතු සියයට 8 ක් වූ රු.68,976 ක දායක මුදල සභා අරමුදලින් ගෙවා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විශේෂ සභා තීරණ අංක 1860 ප්‍රකාරව සභා අරමුදලින් ගෙවා ඇත. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ150 (4) වගන්තිය | සභාවට අයත් ආදායම් අය කිරීම සඳහා සභාවේ ලේකම්ගේ අවධානය යොමු වී නොතිබුණි. | පනතේ වගන්තිය ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ආදායම් අය කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු ගාස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි . |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,884,732 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,520,472 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,569,000 | 1,184,082 | 1,209,492 | 107,689 | 1,449,000 | 1,261,776 | 1,212,335 | 133,099 |
| කුලී | 6,547,600 | 1,922,145 | 1,745,537 | 272,336 | 2,963,600 | 1,676,617 | 1,674,117 | 95,728 |
| බලපත්‍ර ගාස්තු | 639,500 | 786,642 | 787,442 | 16,000 | 632,000 | 457,734 | 457,734 | 16,800 |
| වෙනත් ආදායම් | 24,889,800 | 21,811,557 | 11,496,947 | 49,572,654 | 18,509,700 | 20,898,757 | 9,554,261 | 39,258,044 |
| **එකතුව** | 33,645,900 | 25,704,426 | 15,239,418 | 49,968,679 | 23,554,300 | 24,294,884 | 12,898,447 | 39,503,671 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.33,645,900 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.39,503,671 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.25,704,426 ක් සමඟ රු. 65,208,097 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.15,239,418 ක් පමණක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.49,968,679 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.123,732 ක් වූ අතර, රු.148,738 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.272,470 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.180,229 ක් වූ නිසා වර්ෂය අවසානයට රු.92,241 ක් හිඟව පැවතුණි. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉතිරි හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු මුදල රු.11,729 ක් වූ අතර, වර්ෂයේ රු.4,502 ක බිල් කිරීම් සමඟ රු. 16,231 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.1,364 ක් වූ නිසා වර්ෂය අවසානයට රු. 14,867 ක් හිඟව පැවතුණි. ආරම්භක හිඟයෙන් සියයට 4.16 ක් හා බිල්කිරීම්වලින් සියයට 20.1 ක් වර්ෂය තුළ අයකරගෙන තිබුණි. | හිඟ අක්කර බදු කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉතිරි හිඟ ශේෂයන් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**2.2.4** බදු කුලී

----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආරම්භක හිඟය රු.95,728 ක් වූ අතර, රු.1,712,845 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.1,808,573 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.1,543,462 ක් වූ නිසා, වර්ෂය අවසානයට රු.265,111 ක් හිඟව පැවතුණි. ආරම්භක හිඟ ශේෂයෙන් රු.19,500 ක් වර්ෂය තුළ අයවී තිබුණි. | බදු කුලී කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**2.2.5** **ව්‍යාපාර බදු**

------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය රු.16,800 ක් වූ අතර වර්ෂය සඳහා බිල් කිරීම් රු.830,600 ක් සමඟ රු.847,400 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.831,400 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,000 ක මුදලක් හිඟව පැවතුණි. ආරම්භක හිඟ ශේෂයෙන් කිසිඳු මුදලක් අයවී නොතිබුණු බව නිරීක්ෂණය විය. | කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟය ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.6** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,398,511 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.48,174,143 ක මුදලක් අය විය යුතුව තිබුණි. | කඩිනමින් අයකළ යුතු වේ. | ඉතිරි හිඟ මුදල් ගෙන්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කාර්ය සාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තිය ප්‍රකාරව 2014 අගෝස්තු 29 දිනැති අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදය ප්‍රකාරව අත්‍යාවශ්‍ය සේවා සැපයුම් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවාගෙන ඇතත් 2019 මැයි 05 වන විටත් ක්‍රියාත්මකව නොතිබුණි. | පනතේ විධිවිධාන හා ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතු වේ. | දැනට ක්‍රියාත්මක වන කාර්යයන් 6 ක් ක්‍රියාත්මක කරමින් ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මාලිම්බඩ අලවත්තහේන ඉඩමේ ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් 2000 වර්ෂයේ සභාව වෙත ලැබී තිබූ රු.1,000,000 ක මුදල අදාළ කාර්යයේ නොයොදවා 900,000 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල යොදවා තිබුණි. ඉතිරි රු.100,000 න් ආදාහනාගාරය ඉදිකිරීම් සඳහා වැඩ ආරම්භ කර අතහැර දමා තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත තෘතීයික තනතුර අනුමත කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත කාර්යමණ්ඩලයේ තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේ පළාත් පාලන ආයනවල යටිතල පහසුකම් නගාසිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන යටතේ රු.1,800,093 ක වියදමක් දරා ඉදිකර තිබූ මාලිම්බඩ පොදු වෙළඳපොලේ බිම් මහල | සභාව සතු වත්කම් ඵලදායී කාර්යයකට යොදා ගත යුතු වේ. | ඉතිරි වැඩ කොටස් සහා අරමුදලින් අවසන් කර ඉදිරියේදී පොළ පැවැත්වීමට කටයුතු කරමි. |

වසර දෙකක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

**3.5** **හදුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක අර්ථ සාධක අරමුදලට බැර කළ යුතු දායක මුදල් නියමිත දිනට ප්‍රථම එකී අරමුදලට බැර නොකිරීම හේතුවෙන් රු.86,220 ක අධිභාරයක් පනවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.43,110 ක් සහා අරමුදලින් ගෙවා තිබුණි. | වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභා තීරණ අංක 5.18 ප්‍රකාර සභා අරමුදලින් ගෙවීම් කරන ලදී. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වැය විෂයන් 08 ක රු.14.264,909 ක ඉතිරිවීම් තිබුණි. එම අගයන් සියයට 15.3 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුනි. | තාත්විකව වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | අයවැය ගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් අවම මට්ටමකින් පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | අදායම් විෂයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව 9,966,892 ක් වූ අතර එම අගයන් සියයට 7.7 සිට සියයට 70.6 දක්වා පරාසයක පැවතුණි. | තාත්විකව වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | අයවැය ගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් අවම මට්ටමකින් පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වේ. | කටයුතු කිරීමට නොහැකි විය. |
| (ආ) | මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගේ එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී විගණන වාර්තාවල පිටපත් එවීමට කටයුතු කරමි. |

## 4.3 නොවිසඳී ඇති විගණන ඡේද

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු අක්කර 09 රූඩ් 01 පර්චස් 36 ක් වූ ඉඩම් කැබලි 10 ක් නිෂ්ක්‍රීයව පවතින අතර, සභාව සතු අක්කර 25 පර්චස් 18 කින් යුත් ඉඩම් කැබලි 38 ක මායිම් ලකුණු කර ආරක්ෂා කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි. | සභාව සතු දේපළ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව විසින් මිලදී ගෙන තිබූ රු. 175,644 ක් වටිනා කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය 2012 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව තිබුණි. | ඵලදායී කාර්යයන් සඳහා යොදා ගත යුතු වේ. | වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු පිරිවැය රු.7,967,144 ක් වූ ගල් රෝල පැයට රු.1,500 ක් බැගින් පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට බදු දීම නිසා අයවිය යුතු රු.105,000 ක මුදල සභාවට අයවී නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. | හිඟ මුදල මුලින් රු.77,400 ක් රඳවුම් තැන්පත්වලින් හිලව් කර ඉතිරි රු.31,825ක මුදල ඉන්ධන සැපයීම සඳහා හිලව් කිරීමට සභා තීරණයක් ගෙන ඇත. |